# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 210/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 05/02/2024
පැය 1700

## මාධ්‍ය නිවේදනය

**ඇඹිලිපිටිය මිද්දෙනිය මාර්ගයේ පාලමක් කඩා වැටී මාර්ගය අවහිර වීමක් - ඇඹිලිපිටිය පොලිස් වසම.**

2024.02.05 වන අද දින උදැසන කාලයේදී ඇඹිලිපිටිය පොලිස් වසමේ ඇඹිලිපිටිය මිද්දෙනිය මාර්ගයේ මිද්දෙනිය දෙස සිට ඇඹිලිපිටිය දෙසට ධාවනය වූ ලොරි රථයක් කුඹුගොඩආර ආසන්නයේ ඇති පාලම කැඩී ගොස් ලොරි රථය ඇළට පෙරළී ඇත. අනතුරින් ජිවිත හානි කිසිවක් සිදුව නොමැති අතර, පාලම කැඩී යාම හේතුවෙන් එම මාර්ගයේ වාහන ගමනාගමනය ඇන හිට ඇත. මේ හේතුවෙන් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය රියදුරන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- **ඇඹිලිපිටිය සිට මිද්දෙනිය දෙසට ගමන් ගන්නා වාහන කුට්ටිගල මාර්ගයේ කුදුරුගස්ආර හන්දියෙන් හැරී කඩදාසි කම්හල හරහා කුඹුගොඩආරට පැමිණ මිද්දෙනිය දෙසට ගමන් කළ හැකිය.**

- **රත්නපුර දෙස සිට ඇඹිලිපිටිය හරහා මිද්දෙනිය දෙසට ගමන් කරන වාහන උඩගම හන්දියේ ඩෙන්සිල් කොබ්බෑකඩුව පිළිරුව අසලින් පනාමුර දෙසට හැරී මුල්ඇඩියාවල හරහා මිද්දෙනිය දෙසට ගමන් කල හැක. මිද්දෙනිය දෙස සිට රත්නපුර හා ඇඹිලිපිටිය දෙසට ගමන් කරන වාහන සඳහා ද මෙම මාර්ගය භාවිතා කළ හැක.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**